# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

## පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය හා බාහිර විභාග මධ්‍යස්ථානයේ
## පශ්චාද් උපාධි පාඨමාලා සඳහා සිසුන් ලියාපදිංචි කිරීම

## 2024 අධ්‍යයන වර්ෂය

**මෙම විශ්වවිද්‍යාලය මගින් පහත දැක්වෙන පශ්චාද් උපාධි පාඨමාලා සඳහා 2023.11.15 දින දක්වා අයදුම්පත් භාරගනු ලැබේ.**

### 01. එක් අවුරුදු බෞද්ධ අධ්‍යයන පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව (P.G.D.) (SLQF 08 - 25 Credits)

**අධ්‍යයන මාධ්‍යය** : සිංහල/ඉංග්‍රීසි

**පාඨමාලා ගාස්තුව** : දේශීය සිසුන් සඳහා - රු. 31,000/-
විදේශීය සිසුන් සඳහා - US$ 405

**ලියාපදිංචිය සඳහා සුදුසුකම්**

- පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් කවර හෝ විෂයධාරාවක් යටතේ වසර 03කට නොඅඩු උපාධි පාඨමාලාවක් සමත් ව තිබීම.

  හෝ
- ප්‍රාචීන අවසාන උපාධිය ලබා තිබීම.

  හෝ
- ඉහත සඳහන් සුදුසුකම්වලට සමාන යැයි විශ්වවිද්‍යාලයේ සනාතන සභාව මගින් පිළිගනු ලබන වෙනත් සුදුසුකමක් සපුරා තිබීම.

### 02. එක් අවුරුදු ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව (M.A.) (SLQF 09 - 30 Credits)

**අධ්‍යයන මාධ්‍යය** : සිංහල/ඉංග්‍රීසි

**අධ්‍යයන විෂය ධාරාව** : බෞද්ධ අධ්‍යයන/ සිංහල/ පාලි/ සංස්කෘත/ ඉංග්‍රීසි

**පාඨමාලා ගාස්තුව** : දේශීය සිසුන් සඳහා - රු. 45,000/-
විදේශීය සිසුන් සඳහා - US$ 555

**ලියාපදිංචිය සඳහා සුදුසුකම්**

ඉහත අංක 01 යටතේ වන සුදුසුකම්

### 03. ශාස්ත්‍රපති (දෑවුරුදු) පර්යේෂණ උපාධි පාඨමාලාව (M.A.) (SLQF 10 - 60 Credits)

**අධ්‍යයන මාධ්‍යය** : සිංහල/ඉංග්‍රීසි

**අධ්‍යයන විෂය ධාරාව** : බෞද්ධ අධ්‍යයන/ සිංහල/ පාලි/ සංස්කෘත/ ඉංග්‍රීසි

**පාඨමාලා ගාස්තුව** : දේශීය සිසුන් සඳහා - රු. 74,500/-
විදේශීය සිසුන් සඳහා - US$ 705

**ලියාපදිංචිය සඳහා සුදුසුකම්**

ඉහත අංක 01 යටතේ වන සුදුසුකම්

හෝ

පිළිගත් විශ්වවිද්‍යාලයක එක් අවුරුදු ශාස්ත්‍රපති උපාධිය සමත් වීම.

## 04. දර්ශනපති උපාධි පාඨමාලාව (M.Phil.) (වසර දෙකකි) (SLQF 11)

| | | |
|---|---|---|
| **විෂය ධාරාව** | : | බෞද්ධ දර්ශනය/ බෞද්ධ සංස්කෘතිය/ බෞද්ධ ශිෂ්ටාචාරය/ බෞද්ධ අධ්‍යයනය/ සිංහල/ පාලි/ සංස්කෘත/ පුරාවිද්‍යාව/ සමය අධ්‍යයනය හා තුලනාත්මක දර්ශනය/ ඉංග්‍රීසි |
| **අධ්‍යයන මාධ්‍යය** | : | සිංහල/ඉංග්‍රීසි |
| **පාඨමාලා ගාස්තුව** | : | දේශීය සිසුන් සඳහා - රු.100,000/- |
| | | විදේශීය සිසුන් සඳහා - US$ 1305 |

**ලියාපදිංචිය සඳහා සුදුසුකම්**

- ඉහත විෂය ධාරාවන්ට අදාළ ව ප්‍රථම පන්ති/දෙවන පෙළ ඉහළ පන්ති සාමර්ථ්‍යයක් සහිත ව ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියක් ලබා තිබීම.

  හෝ

- පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉහත විෂය ධාරාවන්ට අදාළ ව ශාස්ත්‍රපති එක් අවුරුදු උපාධි පාඨමාලාවකින් සමත් වීම.

  හෝ

- වෙනත් ඕනෑම විෂය ධාරාවකින් ප්‍රථම පන්ති/දෙවන පෙළ ඉහළ පන්ති සාමර්ථ්‍යයක් සහිත ව ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියක් හෝ ශාස්ත්‍රපති උපාධියක් හෝ ලබා ඇති අපේක්ෂකයෙකු ඉහත විෂය ධාරාවන්ට අදාළව පශ්චාද් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම. (එහිදී පශ්චාද් උපාධි ඩිප්ලෝමාවට අදාළ විෂය ධාරාවෙන් දර්ශනපති උපාධිය සඳහා ලියාපදිංචි විය හැකි ය.)

  හෝ

- ඉහත සඳහන් සුදුසුකම්වලට සමාන යැයි විශ්වවිද්‍යාලයේ සනාතන සභාව මගින් පිළිගනු ලබන වෙනත් සුදුසුකමක් සපුරා තිබීම.

## 05. ආචාර්ය උපාධි පාඨමාලාව (Ph.D.) (වසර තුනකි) (SLQF 12)

| | | |
|---|---|---|
| **විෂය ධාරාව** | : | බෞද්ධ දර්ශනය/ බෞද්ධ සංස්කෘතිය/ බෞද්ධ ශිෂ්ටාචාරය/ බෞද්ධ අධ්‍යයනය/ සිංහල/ පාලි/ සංස්කෘත/ පුරාවිද්‍යාව/ සමය අධ්‍යයනය හා තුලනාත්මක දර්ශනය/ ඉංග්‍රීසි |
| **අධ්‍යයන මාධ්‍යය** | : | සිංහල/ඉංග්‍රීසි |
| **පාඨමාලා ගාස්තුව** | : | දේශීය සිසුන් සඳහා - රු. 122,000/- |
| | | විදේශීය සිසුන් සඳහා - US$ 1755 |

**ලියාපදිංචිය සඳහා සුදුසුකම්**

- ඉහත විෂය ධාරාවන්ට අදාළ ව පිළිගත් විශ්වවිද්‍යාලයකින් වසර දෙකකට නොඅඩු පර්යේෂණ පශ්චාද් උපාධියක් ලබා තිබීම/ සාමාජීය විද්‍යාපති උපාධියක් (MSSc)/ දර්ශනපති උපාධියක් (M.Phil.) ලබා තිබීම.

  හෝ

- ඉහත සඳහන් සුදුසුකම්වලට සමාන යැයි විශ්වවිද්‍යාලයේ සනාතන සභාව මගින් පිළිගනු ලබන වෙනත් සුදුසුකමක් සපුරා තිබීම.

### ශිෂ්‍යත්ව සඳහා ඉල්ලුම් කිරීම

**පිරිනමනු ලබන ශිෂ්‍යත්ව**

- ✓ ෂින්යෝ එන් ෂින්සෝ ඉතො ශිෂ්‍යත්වය
- ✓ ශ්‍රී සරණංකර භාරකාර අරමුදල් ශිෂ්‍යත්වය
- ✓ වෙනත් ශිෂ්‍යත්ව (සිංහල හා ඉංග්‍රීසි ශාස්ත්‍රපති පාඨමාලාවන් සඳහා පමණි.)

දේශීය හා විදේශීය වශයෙන් බෞද්ධ අධ්‍යයන ක්ෂේත්‍රයේ පශ්චාද් උපාධි පාඨමාලා හදාරන විද්‍යාර්ථීන් සඳහා පූර්ණ හෝ අර්ධ ලෙස මෙම ශිෂ්‍යත්ව පිරිනැමේ.

- **මින්යෝ එන් මින්සෝ ඉතො ශිෂ්‍යත්වය**

<u>පූර්ණ ශිෂ්‍යත්ව</u>

| පාඨමාලාව | | මුළු සංඛ්‍යාව | දේශීය (පැවිදි) | දේශීය (ගිහි) | විදේශීය (ගිහි/පැවිදි) |
|---|---|---|---|---|---|
| ශාස්ත්‍රපති (එක් අවුරුදු) | පාලි | 10 | 3 | 1 | - |
| | බෞද්ධ අධ්‍යයනය | | 3 | 1 | - |
| | සංස්කෘත | | 1 | 1 | - |

<u>අර්ධ ශිෂ්‍යත්ව</u>

| පාඨමාලාව | | මුළු සංඛ්‍යාව | දේශීය (පැවිදි) | දේශීය (ගිහි) | විදේශීය (ගිහි/පැවිදි) |
|---|---|---|---|---|---|
| ශාස්ත්‍රපති (එක් අවුරුදු) | පාලි | 20 | 3 | 1 | 1 |
| | බෞද්ධ අධ්‍යයනය | | 6 | 4 | 2 |
| | සංස්කෘත | | 2 | 1 | - |
| ශාස්ත්‍රපති (දෑවුරුදු) | පාලි | 5 | 2 | 1 | - |
| | බෞද්ධ අධ්‍යයනය | | 1 | | - |
| | සංස්කෘත | | 1 | | - |
| දර්ශනපති | | 3 | 2 | | 1 |
| ආචාර්ය | | 3 | 2 | | 1 |

- **ශ්‍රී සරණංකර භාරකාර අරමුදල් ශිෂ්‍යත්වය**

<u>අර්ධ ශිෂ්‍යත්ව</u>

| පාඨමාලාව | | මුළු සංඛ්‍යාව | දේශීය (පැවිදි) | දේශීය (ගිහි) | විදේශීය (ගිහි/පැවිදි) |
|---|---|---|---|---|---|
| ශාස්ත්‍රපති (එක් අවුරුදු) | පාලි | 10 | 3 | 1 | - |
| | බෞද්ධ අධ්‍යයනය | | 2 | 1 | - |
| | සංස්කෘත | | 2 | 1 | - |

- **වෙනත් ශිෂ්‍යත්ව**

<u>පූර්ණ ශිෂ්‍යත්ව</u>

| පාඨමාලාව | | මුළු සංඛ්‍යාව | දේශීය (පැවිදි) | දේශීය (ගිහි) | විදේශීය (ගිහි/පැවිදි) |
|---|---|---|---|---|---|
| ශාස්ත්‍රපති (එක් අවුරුදු) | සිංහල | 08 | 03 | | |
| | ඉංග්‍රීසි | | 05 | | |

මෙම ශිෂ්‍යත්ව සඳහා ඉල්ලුම් කිරීමේදී පාඨමාලා අයදුම්පත්‍රය සමග ම ශිෂ්‍යත්ව අයදුම්පත ද ඉදිරිපත් කළ යුතුයි. අන්තර්ජාලයේ www.bpu.ac.lk දරන විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියෙන් මෙම ශිෂ්‍යත්ව පිළිබඳ වැඩි විස්තර හා අයදුම්පත ලබා ගත හැකි යි.

**සැලකිය යුතුයි :** **දර්ශනපති/ආචාර්ය උපාධි සඳහා ඉල්ලුම් කරන සියලුම අපේක්ෂකයින් ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය හා බාහිර විභාග මධ්‍යස්ථානය මඟින් පවත්වනු ලබන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවට අයත් MABS 53015 - බුදුසමයේ දාර්ශනික ප්‍රවණතා විෂය පත්‍රය සහ MARM 53065 - පර්යේෂණ ක්‍රමවේදය විෂය පත්‍රය සමත් විය යුතුයි.**

**ශාස්ත්‍රපති (එක් අවුරුදු/දෑවුරුදු) උපාධි පාඨමාලාව සඳහා ඉංග්‍රීසි විෂය ධාරාවෙන් පෙනී සිටීමට අපේක්ෂා කරන්නේ නම්, ශාස්ත්‍රවේදී (විශේෂ/සාමාන්‍ය) උපාධිය සඳහා ඉංග්‍රීසි භාෂාව විෂයක් වශයෙන් හදාරා තිබීම අනිවාර්යය වේ.**

**හෝ**

**ඉංග්‍රීසි භාෂාව/සාහිත්‍යය/ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අනුමත විශ්වවිද්‍යාලයකින් පශ්චාද් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම.**

**සහ**

**එම අපේක්ෂකයන් ඉංග්‍රීසි අධ්‍යයනාංශය මගින් පවත්වනු ලබන තෝරාගැනීමේ ලිඛිත පරීක්ෂණයට පෙනී සිට ඉන් සමත් වීම හා සම්මුඛ පරීක්ෂණය සඳහා පෙනී සිටිය යුතුය.**

**පාඨමාලා සඳහා අයදුම් කළ යුතු පිළිවෙල :**

**<u>අයදුම්පත් ගාස්තුව</u> :**

| | | |
|---|---|---|
| බෞද්ධ අධ්‍යයන පශ්චාද් උපාධි ඩිප්ලෝමා/ශාස්ත්‍රපති උපාධි (එක් අවුරුදු/දෑවුරුදු) | - | රු. 1000/- |
| දර්ශනපති/ආචාර්ය උපාධි පාඨමාලා | - | රු. 1000/- |

අයදුම්පත් හා විස්තර පත්‍රිකා ලබා ගැනීම සඳහා දිවයිනේ ඕනෑ ම ලංකා බැංකු ශාඛාවකින්, ගිණුම් අංක **711202** ට **'ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය'** නමින් අදාළ අයදුම්පත්‍ර ගාස්තුව ගෙවා ලබා ගන්නා ලදුපත විශ්වවිද්‍යාලයේ පහත සඳහන් ලිපිනයේ පිහිටි කාර්යාලය වෙත පැමිණ ඉදිරිපත් කිරීමෙන් හෝ ලියාපදිංචි තැපැල් මගින් එවීමෙන් අයදුම්පත් හා විස්තර පත්‍රිකා **2023.11.08** දක්වා ලබා ගත හැකි ය. තැපැල් මගින් අයදුම්පත් හා විස්තර පත්‍රිකා ලබා ගැනීමට අපේක්ෂා කරන්නේ නම් ඉහත ගිණුම් අංකයට අයදුම්පත්‍ර ගාස්තුව ගෙවා ලබා ගන්නා ලදුපත සමග තම නම, ලිපිනය ලියන ලද 9''x4'' ප්‍රමාණයේ රු. 110/ක මුද්දර ඇලවූ කවරයක් පහත සඳහන් ලිපිනයට එවිය යුතු ය.
එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ පාඨමාලාවේ නම සඳහන් කර, **'අයදුම්පත්‍ර ලබා ගැනීම'** යනුවෙන් සඳහන් කළ යුතු ය. චෙක්පත් හෝ තැපැල් ඇණවුම් භාර ගනු නොලැබේ.

සහකාර ලේඛකාධිකාරී,
පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය හා බාහිර විභාග මධ්‍යස්ථානය,
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,
අංක 214, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

**අයදුම්පත්‍ර ගාස්තුව ගෙවීමේ දී අදාළ පාඨමාලාවේ කෙටි නාමය සඳහන් කළ යුතු ය.**
**(P.G.D./M.A./M.Phil./Ph.D.)**

අන්තර්ජාලයේ www.bpu.ac.lk දරන විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියෙන් ද අයදුම්පත් ලබා ගත හැකි ය. එසේ ලබා ගන්නා අයදුම්පත් විශ්වවිද්‍යාලයට භාරදීමේ දී දිවයිනේ ඕනෑ ම ලංකා බැංකු ශාඛාවකින්, ඉහත ගිණුම් අංකයට අයදුම්පත්‍ර ගාස්තුව ගෙවා ලබා ගන්නා ලදුපත සමඟ ඉදිරිපත් කළ යුතු ය.

**<u>අයදුම්පත් නිකුත් කරන අවසාන දිනය</u>**

- පශ්චාද් උපාධි ඩිප්ලෝමා සහ ශාස්ත්‍රපති (එක් අවුරුදු/දෑවුරුදු) පාඨමාලා සඳහා **2023.11.08** දින දක්වා පමණක් අයදුම්පත් නිකුත් කරනු ලැබේ.
- දර්ශනපති හා ආචාර්ය උපාධි පාඨමාලා සඳහා වසරේ ඕනෑම දිනක දී අයදුම්පත් ලබා ගත හැකි ය.

නිවැරදි ව සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2023.11.15** දිනට පෙර ඉහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතු ය.

වැඩි විස්තර සඳහා : 0112580609

ලේඛකාධිකාරී
පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය හා බාහිර විභාග මධ්‍යස්ථානය
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,
නො. 214, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

2023.09.20